# වාත්තු අංශයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ වාත්තු කරුවන්ට සැපයෙන සේවා

**ඩබ්.ඩී.ලීලාරත්න**
**වාත්තු කළමනාකාර**
**වාත්තු අංශය**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඉංජිනේරු අංශය මගින් පාලනයවන වාත්තු අංශය, කුඩා හා මධ්‍ය පරිමාණ වාත්තු කාර්මාන්ත නගාසිටුවීමේ අරමුණින් 1968 වර්ෂයේ කටුබැද්දෙහි ස්ථාපනය කරන ලදී. තාක්ෂණ දියුණුවත් සමඟ, කාලීන අවශ්‍යතාවය මත, ජපාන ජාත්‍යාන්තර සහයෝගීතා ඒජන්සියේ (JICA) ආධාර යටතේ 1995 වර්ෂයේදී පස් අවුරුදු වාත්තු තාක්ෂණ සංවර්ධන ව්‍යාපෘතිය මගින් නව යන්ත්‍රෝපකරණ වලින් සමන්විතව මෙම වාත්තු අංශය නවීකරණය කරන ලදී. මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේද ලංකාවේ වාත්තු කර්මාන්ත සඳහා උපදේශක සේවා ලබාදීමෙන් තත්ත්වයෙන් උසස් ප්‍රමිතීන්ට අනුකූලව වාත්තු භාණ්ඩ නිපදවීමට කර්මාන්තකරුවන් උනන්දු කරවීම හා එමගින් ආනයන කරනු ලබන වාත්තු කොටස් ලංකාව තුළ නිෂ්පාදන කිරීමට උනන්දු කරවීමයි.

මෙම ව්‍යාපෘතිය මගින් වීනච්චට්ටි ( Cast Iron) පිත්තල ( Brass), ලෝකඩ ( Broze ) වාත්තු නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා වාත්තු මල් සැකසීම ( Pattern Maker), වාත්තු පස් හා අච්චු සැකසීම (Moulding), ලෝහ උණු කිරීම ( Melting ), හා රසායනාගාර පරිපාලන ( Laboratary Testing ) යන අංශ යටතේ නවීන යන්ත්‍රෝපකරණ ස්ථාපනයකර ඇත. වාත්තු මල් සැකසීමේ අංශය වාත්තු භාණ්ඩවලට අවශ්‍ය ලී වාත්තු මල් නිෂ්පාදනය කිරීම අවශ්‍ය යන්ත්‍රෝපකරණ වලින් යුක්තවන අතර, සංකීර්ණ වාත්තු මල් සෑදීමේ හැකියාව ඇත. වාත්තු පස් සැකසීම් අංශය මගින් වාත්තු භාණ්ඩ සඳහා ගේට්ටු පද්ධති නිර්මාණය කිරීම, වාත්තු පස් සැකසීම, වාත්තු පස් අච්චු සැකසීම කරනු ලබයි. තෙත වාත්තු පස් සැකසීම සඳහා යන්ත්‍රෝපකරණ ඉබේ සවිවන වාත්තු පස් ( පුරාන්සැන්ඩ් ) සැකසීම සඳහා යන්ත්‍රෝපකරණද ඇත. සාමාන්‍යයෙන් වාත්තු අච්චු සැකසීම තෙත වාත්තු පස් යොදා ගැනීමෙන් කරනු ලබයි, පූරාන් සැන්ඩ් විශාල වාත්තු භාණ්ඩ නිෂ්පාදනයේදී අච්චු සැකසීම සඳහා හා කෝර නිෂ්පාදනය සඳහා යොදා ගනු ලැබේ. ලෝහ උණු කිරීමේ අංශය මගින් ලෝහවල රසායනික සංයුතියට අනුකූලව ලෝහ උණු කිරීම සිදු කරනු ලබයි. මෙහිදී වීනච්චට්ටි ( grey cast iron ) උණු කිරීම සඳහා කියුපෝලාව උපයෝගී කරගනු ලබන අතර, ගෝලාභන වීනච්චට්ටි නිෂ්පාදනය සඳහා විදුලි බලයෙන් ක්‍රියා කරන අධිප්‍රේරණ උදුන ( High Frequency Induction Furnance ) භාවිතා වේ. මීට අමතරව යකඩ නොවන ලෝහ උණු කිරීම සඳහා උදුන් දෙකක් උපයෝගී කර ගනී. රසායනාගාර පරීක්ෂණ අංශය සඳහා වාත්තු පස්වල ගුණාංග පරීක්ෂා කිරීමේ උපකරණ හා ලෝහවල රසායනික සංයුතිය පරීක්ෂාව සඳහා ස්පෙක්ට්‍රෝ මීටර ( Sprectrometer ) උපකරණය වාත්තු අංශය සතුව ඇත.

වාත්තු අංශයේ සියළුම නිලධාරීන් හා සේවකයින්, වීනච්චට්ටි, පිත්තල, ලෝකඩ, වාත්තු නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳව ජපාන විශේෂඥවරුන්ගේ මග පෙන්වීම යටතේ ප්‍රායෝගික පුහුණුව දේශීය වශයෙන් ලබාගෙන ඇත. මෙම නිලධාරීන් වාත්තු මල් තාක්ෂණය, වාත්තු පස් අච්චු සැකසීමේ තාක්ෂණය, ලෝහ උණු කිරීමේ තාක්ෂණය හා රසායනාගාර පරීක්ෂණ ආදී ක්ෂේත්‍ර පිලිබඳව න්‍යායික හා ප්‍රායෝගික විදේශ පුහුණුවීම් ලබාගෙන ඇත.

වාත්තු අංශය වීනච්චට්ටි ( cast iron ) භාණ්ඩ දෙවර්ගයක් නිෂ්පාදනය කරනු ලබයි. එනම් අළු වීනච්චට්ටි ( grey cast iron ). ගෝලාභන වීනච්චට්ටි ( ductile cast iron ) වේ. අළු වීනච්චට්ටි මගින් සාමාන්‍ය යන්ත්‍ර කොටස් නිපදවීම කරනු ලබන අතර, විශේෂ යන්ත්‍ර කොටස් හා මැන්හෝල් කවර ( man hole cover ) ගෝලාභන වීනච්චට්ටි මගින් නිෂ්පාදනය කරනු ලබයි. **මෙම ගෝලාභන වීනච්චට්ටි දේශීය කර්මාන්තකරුවන්ට හඳුන්වාදිමට හැකිවීම ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඉදිරි පියවරක් ලෙස සැලකිය හැකිය. එමෙන්ම නිෂ්පාදන භාණ්ඩවල නියමිත රසායනික සංයුතියට අනුකූලව ප්‍රමිතීන්ට අනුව වාත්තු භාණ්ඩ නිෂ්පාදනය කිරීමට ඇති හැකියාව විශේෂත්වයකි.**

**ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ වාත්තු කර්මාන්තකරුවන් සඳහා වාත්තු තාක්ෂණය පිළිබඳ උපදෙස් සේවා සැපයීම සඳහා ඇති එකම ආයතනය ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාත්තු අංශයයි.**

## වාත්තු අංශය මගින් සපයන සේවා

* වාත්තු භාණ්ඩ නිෂ්පාදනය සඳහා ලී වාත්තු මල් සැකසීම.
* අළු වීනච්චට්ටි, ගෝලාභන වීනච්චට්ටි භාණ්ඩ නිෂ්පාදනය.
* පිත්තල, ලෝකඩ, ඇලුමිනියම් වාත්තු කොටස් නිෂ්පාදනය.
* වාත්තු පස් පරීක්ෂාව ( වාත්තු පස්වල තෙතමනය, මැටි ප්‍රතිශතය).

- ලෝහවල රසායනික සංයුතිය (chemical analysis ) පරීක්ෂාව
- ලෝහවල ද්‍රවතාවය ( hardnen test ) පරීක්ෂාව
- ලෝහවල ආතන්‍ය බලය (tensile test) පරීක්ෂාව
- ලෝහවල ව්‍යුහ ( microstructure test ) පරීක්ෂාව
- කර්මාන්ත පරීක්ෂාකර ගැටළු සඳහා උපදේශක සේවා සැපයීම
- නව කර්මාන්ත ආරම්භ කිරීම සඳහා උපදේශක සේවා
- කර්මාන්තකරුවන් සඳහා තාක්ෂණ වැඩමුළු/ සම්මන්ත්‍රණ පැවැත්වීම
- කාර්යාලයට පැමිණෙන කර්මාන්තකරුවන් සඳහා උපදෙස් සැපයීම.
- වාත්තු තාක්ෂණ පුහුණු පාඨමාලා ( දින 10 හෝ දින 15 වැඩ සටහන ) පැවැත්වීම.
- වාත්තු මල් තාක්ෂණය ( Pattern Making )
- වාත්තු පස් සැකසීම හා වාත්තු පස් අච්චු සැකසීමේ තාක්ෂණය ( Moulding Sand and Moulding )
- ලෝහ උණු කිරීමේ තාක්ෂණය ( Melting )
- අවශ්‍යතා මත කර්මාන්තකරුවන්ට ප්‍රායෝගික පුහුණුව ලබාදීම.
- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ඉංජිනේරුවන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම.

*22 පිටුවෙන්...*

වුවද වෙළඳ ලකුණ වලංගු වන දිනය ලෙස සැලකෙන්නේ අයදුම්පත ගාස්තුවක් සමග බුද්ධිමය දේපල කාර්යාලයට ඉදිරිපත් කළ දිනයයි. අයදුම් කළ දිනයේ සිට වසර දහයක් දක්වා ලියාපදිංචි ලකුණක් වලංගුවන අතර, අලුත් කිරීමේ ගාස්තුවක් සෑම අවුරුදු දහයකට වරක්ම ගෙවීමෙන් ලියාපදිංචිය අලුත් කරවා ගත හැකිවේ.

### වෙළඳ ලකුණක ඇති වැදගත්කම

ලියාපදිංචි වූ වෙළඳ ලකුණක අයිතිකරුවකුගේ අවසරය නොමැතිව එම ලකුණු භාවිතා කිරීමට තුන්වන පාර්ශවයකට නොහැකිය. ව්‍යාපාරිකයෙකු තම ව්‍යාපාරය අන්සතු කිරීමකදී තමාගේ ලියාපදිංචි කළ වෙළඳ ලකුණට, එහි ඇති කීර්ති නාමය වෙනුවෙන් හොඳ මිලක් ලබාගත හැකි වනු ඇත. තවද තම ලියාපදිංචි ලකුණ යටතේ හොඳ තත්ත්වයෙන් යුතු භාණ්ඩයක් හෝ සේවාවක් සපයන්නේ නම් මහජනයා අතර, එම ලකුණ ප්‍රසිද්ධියට පත්වනු ඇත. ඒ අනුව එම ව්‍යාපාරයේ දීර්ඝ කාලීන දියුණුවක් ඇතිවනු ඇත.

භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා පමණක් නොව යම් ව්‍යාපාරිකයෙකුට තම ව්‍යවසායේ ව්‍යාපාර නාමය වුවද ඉහත අකාරයටම ලකුණක් සේ ලියාපදිංචි කරගැනීමේ හැකියාව ඇත. එසේ කිරීමෙන් එම ව්‍යවසායට වැඩි වැදගත්කමක් ලැබෙනු ඇත.

## සුනාමියෙන් හානි වූ කර්මාන්ත සඳහා සහන සැලසීමේ වැඩසටහන

හානියට පත් කර්මාන්ත පිළිබඳ 2005 ජනවාරි මාසයේදී පැවැත්වූ සමීක්ෂණයේ ප්‍රතිඵල පදනම් කොට ගනිමින් තෝරාගත් ව්‍යාපාර ක්ෂේත්‍ර සඳහා උපකරණ කට්ටල සහ අමුද්‍රව්‍ය බෙදාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කොට තිබේ. කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශයේ අනුග්‍රහය මත ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ මෙහෙයවීමෙන් උපකරණ හා අමුද්‍රව්‍ය බෙදාදීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක වන අතර, පළමු අදියර දී රු. 15,000/- ක් උපරිමකයකට යටත්ව පහත ක්ෂේත්‍රයන් සඳහා උපකරණ කට්ටල ලබාදීම සිදුකෙරේ.

- ලණු ඇඹරුම් කර්මාන්තය
- ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ නිෂ්පාදන සහ අළුත්වැඩියාව
- වඩු කර්මාන්තය
- සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන
- බේකරි හා රසකැවිලි නිෂ්පාදන
- ඇඟලුම් මැසීමේ ව්‍යාපාරය
- යතුරුපැදි අළුත්වැඩියාව
- පාපැදි අළුත්වැඩියාව
- ලොන්ඩ්‍රි

මේ වන විටත් මාතර, හම්බන්තොට, ගාල්ල සහ මඩකලපුව දිස්ත්‍රික්ක සඳහා උපකරණ කට්ටල සහ අමුද්‍රව්‍ය සපයා අවසන්.

**"ගුරු පැහැයෙන් රන් පැහැයට"** කර්මාන්ත සංවර්ධන වැඩසටහන යටතේ කළමනාකරණ 'අ' වැඩසටහන පහත සඳහන් ගම්මානයන්හි පවත්වන ලදී.

| | | | |
|---|---|---|---|
| 1. | කම්මල් ගම්මානය | වැබඩ | ගම්පහ |
| 2. | සිමෙන්ති මල් පෝච්චි නිෂ්පාදනය | නෙලවල | මොරටුව |
| 3. | කම්මල් ගම්මානය | ඇපලාව | කෑගල්ල |
| 4. | ස්වර්ණාභරණ ගම්මානය | දෙල්දෙණිය | කෑගල්ල |
| 5. | මැටි ගම්මානය | බල්ලපාන | කෑගල්ල |
| 6. | වේවැල් නිෂ්පාදන | රදාවඩුන්න | ගම්පහ |
| 7. | මැටි | රුක්මලේ | කුරුණෑගල |
| 8. | මැටි | උණලීයිය | කුරුණෑගල |
| 9. | රබර් මෙට්ට | කහපොල | කොළඹ |